# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.02.14 පැය 1000 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 309/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මාරක රිය අනතුරක් - කොස්වත්ත පොලිස් වසම**

2025.02.14 වන දින උදෑසන කාලයේ කොස්වත්ත පොලිස් වසමේ B 419 ප්‍රධාන මාර්ගයේ හාල්දඩුවන ප්‍රදේශයේදී මාදම්පේ දෙස සිට තෝප්පුව දෙසට ධාවනය වූ කාර් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. යතුරුපැදියේ පැදිකරු බරපතල තුවාල ලබා දංකොටුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වූ පතහවත්ත, වෙන්නප්පුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුරට පත් කාර් රථයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මොහොමඩ් ෆයිසාල් මහතා අද දින පාර්ලිමේන්තු සැසි වාරය සඳහා සහභාගී වීමට ගමන් කරමින් සිටියදී කාර් රථයේ රියදුරුට නින්ද යාම හේතුවෙන් මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශන වලදී අනාවරණය වේ.
මෘත ශරීරය දංකොටුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කොස්වත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**